ලංකාවිත්ති
LANKA VITHTHI

LANKA VITHTHI
P. O. BOX 6 4 6 7 8
LONDON NW3 9LS
E N G L A N D

*Phone* : 0 2 0 7 4 2 8 9 3 8 8
*Fax* : 0 8 7 1 9 0 0 5 1 6 3
*E-mail* : lanka.viththi @ virgin.net

කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : Daya Ananda Ranasinghe

චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna

පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal

ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam



# ජනප්‍රිය පුවත්පතක අවසානය




*ගිය ඉරිදා නිකුත් කළ අවසාන මුද්‍රණය*

**ව**සර 168ක් පුරා මහා බ්‍රිතාන්‍යයේ සෑම තරාතිරමකම ජනතාව, විශේෂයෙන් කම්කරුවන් සාමාන්‍ය සේවකයන් ගෘහණියන් ආදීන් අතර ජනප්‍රියව පැවති **නිව්ස් ඔෆ් ද වර්ල්ඩ් News of the World** නම් ඉරිදා පුවත්පත මේ ගිය ඉරිදා එහි අයිතිකාර මණ්ඩලය විසින් සදහටම නවතාදමන ලදි. එම පුවත්පත වසා දැමීමට හේතු වූයේ එහි සමහර මාධ්‍යකරුවන් තමනට අවැසි පුද්ගලික තොරතුරු දැනගන්නට අවශ්‍ය පුද්ගලයින්ගේ සහ ඒ පවුල්වල ජංගම දුරකතන පණිවුඩවලට හොරෙන් සවන් දී තොරතුරු එකතු කිරීම ඔප්පු වූ නිසාය. එය හඳුන්වන්නේ පෝන් හැකිං phone hacking යනුවෙනි. නීතිය අනුව එවැනි වැඩක් සාපරාධී ක්‍රියාවකි. එම පුවත්පත් මණ්ඩලයේ ප්‍රධාන කර්තෘවරියව සිටි රිබෙකා බෲක්ස් පොලිසිය විසින් අත්අඩංගුවට ගනු ලැබුවාය.

**News of the World** පත්‍රය ආරම්භ කළේ **1843** වසරේ ඔක්තෝබර් **1** වෙනි දා ය. එතැන් පටන් එම පුවත්පත මහා බ්‍රිතාන්‍යයේ ජනතාවට බ්‍රිතාන්‍යයේ පමණක් නොව ලොව සෑම අස්සක් මුල්ලක් නෑර කාල්ගා කාලීන ප්‍රවෘත්ති ගෙන ආවා ය. මේ වසර **168** පුරා රජුන් හා රැජිණන් හය දෙනෙකු රාජ ප්‍රාප්තියට පත්වනු රජකරනු පුවත්පත දැක ඇත. ලෝක යුද්ධ ඇතුළු ලොව විවිධ යුද්ධ ගැන වාර්තාකර ඇත. එමෙන්ම කිසියම් කරදරයක් ව්‍යසනයක් ලොව කොහි හෝ තැනක සිදුවන විට මුලින්ම ඒ ස්ථානයට දුවයන වාර්තාකරුවෝ කැමරා ශිල්පීහු මෙහි වූහ. මෙයට ලිපි ලියූ ලේඛකයින් අතර කීර්තිමත් මහා නවකතා කරු චාර්ලස් ඩිකන්ස් ද වෙයි.

නිව්ස් ඔෆ් ද වර්ල්ඩ් මෙතුවක් තම ජනප්‍රියත්වය රැකගෙන ආවේ සාමාන්‍ය ජනයාගේ මට්ටමට බැස පුවත් හා විශේෂාංග නිශ්පාදනය කළ නිසාය. එහි පළවන බොහෝ ලිපි හා බස විදග්ධ හෙවත් පණ්ඩිත භාෂාව නොවේ. විශාල ක්‍රීඩා පුවත් සැකැස්මක් මෙහි විය. එසේම නළුනිළියන් ඇතුළු ජනප්‍රිය කලා ලෝකයේ සිදුවීම් කළබල කටකතා වල්පල් ආදී පාඨක කුතුහලය අවුස්සන පුවත් එහි ඕනෑවටත් වඩා විය. ප්‍රකට පුද්ගලයන්ගේ පුද්ගලික ජීවිත රහස් බොහෝ විට එළියට ආවේ මේ පුවත්පතේ පිටු තුළිනි. මම ද දිගු කල් එහි පාඨකයෙක්මි. එවැනි පුවත් පතක් යළි නොදැකීම සැබැවින්ම කණගාටුවකි.

# ඇසළ පණිවුඩය



**බු**දුහිමියන්ගෙ ප්‍රථම ඇසළ පණිවුඩය වූයේ පස්වග තවුසන්ට ධම්මචක්කප්පවත්තන සූත්‍රය දෙසා චතුරාර්ය සත්‍යය අවබොධ කරවා ඒ මගින් ධම්මචක්ඛු යයි ඒ සූත්‍රයේම දක්වෙන දහම්ඇස නොහොත් නිවන් දකින මනැස අවදිකර වීමයි. **ඇස්** සහ **අළ** යන දෙපදය සංයෝග වීමෙන් හැදෙන **ඇසළ** යන වචනයෙහි තේරුමත් **ඇස් ඇරීම** යන්නයි. **අළ** යන පරණ සිංහළ වචනයෙහි ඇත්තෙ **අරින ලද** යන තේරුමයි. මෙහිදි බුදුහිමියන් විසින් අරින ලද්දේ පස්වග තවුසන්ගෙ මසැස නොහොත් මස් ඇස නොව මනැස යි. ඉන් අදහස්වන්නෙ මනැස නොහොත් මනස නමැති චිත්තාභ්‍යන්තර අක්ෂිය විවෘත කරවා හිත තුළින් ම නිවන මතුකර පෙන්වීමයි. එසේ සිත තුළින් නිවන උදා කරගැනීමට නොහොත් මතු කර ගැනීමට සිදුවෙන්නෙ අපේම සිතුවිලි වලින් නිවන වැසී යටපත් වී තිබෙන නිසා. ත්‍රිපිටකයෙදි නිවන හැඳින් වෙන්නෙ දුක්ඛ නිරොධය නොහොත් දුක නැති කිරීම කියලයි.

ප්‍රථම බුද්ධ දේශනය වන ධම්මචක්කප්පවත්තන සූත්‍රයෙදි දුක්ඛ නමැති දුක කෙටියෙන් අර්ථ නිරූපණය වෙන්නෙ "සංඛිත්තෙන පංචුපාදානක්ඛන්ධා පි දුක්ඛා" කියලයි. ඉන් අදහස් වෙන්නෙ දුක යනු පංච උපාදානස්කන්ධයන් බවයි. එනම් මම සහ මගේ යයි සලකා සිතින් අල්ලාගනු ලබන රූප - වෙදනා - සඤ්ඤා - සංඛාර - විඤ්ඤාණ යන පංචස්කන්ධයි. මෙයින් දක්වෙන්නෙ සිතුවිලි නමැති චෛතසික ක්‍රියාවලියෙ ප්‍රධාන අවස්ථා පහයි. ඒ ක්‍රියාවලිය ආරම්භයෙදි වෙන්නෙ සිත හා සම්බන්ධ කිසියම් ඉන්ද්‍රියක් කිසියම් නිමිත්තක් ස්පර්ශයෙන් උත්තේජනය වීම නමැති රුප්පනයයි. ඝට්ටීයති පිළීයති යනුවෙන් ධර්මයෙහි අර්ථ විග්‍රහ වෙන පරිදි ගැටීමෙන් පීඩාවට පත්වීම නමැති රූප යනු ඒ රුප්පනයයි. එසේ රුප්පනයෙන් ඉන්ද්‍රියක පරමාණු වටා භ්‍රමණය වන ඉලෙක්ට්‍රෝන ගැටී විද්‍යුත් තේජස නමැති තාපයක් ආරෝපනය වීමයි වේදනා යනු. ඒ වේදනා සුඛ හෝ දුක්ඛ හෝ මධ්‍යස්ථ හෝ වෙන්න හැකිය.

ඒ අනුව මතක සටහන් නමැති චිත්තරූප අවදිවීමටයි සඤ්ඤා කියන්නෙ. ඒ මතක සටහන් පදනම් කරගෙන සිතුවිලි පහළ වීමටයි සංඛාර කියන්නෙ. ඒ සිතුවිලිට පදනම් වන චෙතනා නමැති කර්ම ශක්තිය අනුව භවගාමී විඥාන-ශ්‍රෝතය පෝෂණය වීමටයි විඤ්ඤාණ කියන්නෙ. අපේ පුනරුත්පත්තියට පදනම් වෙන්නෙ එකර්ම ප්‍රවාහයයි. ඒ නිසා කර්මකාරක සිතුවිලි පහළ වීම නතරවූ විටයි යළි උපතක් සිදු නොවන පරිදි අමා මහ නිවන සාක්ෂාත් වෙන්නෙ. දනෙන දේ දනෙන අතර ඒ ගැන කිසිවක් නොසිතන බෞද්ධ භාවනාවෙන් පුරුදු පුහුණු වෙන්නෙ සිතුවිලිවලින් තොරව දනෙන දේ දනිමින් පමණක් ඉන්නයි.

එහෙම ඉන්න පුළුවන් වෙන්නෙ සිතුවිලි පහළවීමට හේතුවෙන ඇලීම් ගැටීම් හා නොදනීම් (රාග-දෝස-මෝහ) නැති වුනාමයි. එසේ වෙන්නෙ ඇති වෙන හැම දෙයක්ම නැතිවෙන බව නමැති අනිත්‍යතාවය අවබොධ වුනාමයි. මේ අනිත්‍යතාව අවබොධයෙන් ධම්මචක්කප්පවත්තන සූත්‍ර දේශනාව අවශානයෙදි කොණ්ඩඤ්ඤ තවුසාණන්ට දකින දහම් ඇස (ධම්මචක්ඛුං) පහළ වුණු බව බුදුහිමියන් විසින් වදාරෙන්නෙ ආයසමතො කොණ්ඩඤ්ඤස්ස විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදිල යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධ ධම්මං ති කියලයි. බුදුහිමියන්ට බුද්ධත්වයේදි මෙම පරම සත්‍යාවබෝධය තහවුරුව සියලු දුක්ගිනි සදහටම නිවී ගියේ ධම්මමචක්කප්පවත්තන සූත්‍රයෙ සඳහන් පරිදි සංඛිත්තෙන පංචුපාදානක්ඛන්ධා දුක්ඛා යනුවෙන් සියලු දුකට මුල පංචුපාදනක්ඛන්ධය බව අවබොධ වී, සිත විසංඛාර ගත වීමෙන් බවයි විසංඛාරගතංචිත්තං යන ප්‍රථම බුද්ධ උදාන පාඨයෙන් කියවෙන්නෙ. සිත විසංඛාරගත වීම යනු සියලුම සිතුවිලි නතරවීමයි.

ඊට එකම මග භාවනාවය.

♦ **සම්මානිත මහාචාර්‍ය**
**ටී. එස්. අබේවික්‍රම**
**Harrow UK**

# ❊ නව සහශ්‍රයට ධර්මානුශාසනා ❊

## *හිතොපදේශයෙන්*

**සර්ව හිංසා නිවෘත්තා යෙ - නරාඨ සර්ව සහාශ්චයෙ**
**සර්වස්‍යාශ්‍රය භූතාශ්ච - ගත නරාඨ සර්වගාමිනඨ**

***අර්ථය*** : **යම් කෙනෙක් (මිනිසුන්) සියළු සත්ව හිංසා වෙන් වැළකුණාහු ද, යම් කෙනෙක් සියල්ල ඉවසන් නාහු ද, සියල්ලන්ටම ආශ්‍රය කිරීමට සුදුසු ඔව්හු ස්වර්ගයට පැමිණෙන්නෝ වෙති.**

සත්පුරුෂයන් සතු ගුණධර්ම දෙකක් මෙම පද්‍යයෙන් ඉදිරිපත්කර ඇත. එනම් සියළු සත්ව හිංසාවන්ගෙන් වැළකීම හා සියල්ල ඉවසීමයි. එක අතකට බලන විට සමාජයේ යහපත් පුද්ගලයෙකු ලෙස ජීවත්වීමට මේ ගුණ ධර්ම දෙක පමණක් වුවද සෑහේ. බොහෝවිට සමාජය අවුල් වියවුල් වලින් ගහන වන්නේ මේ ගුණධර්ම වලින් මිනිසුන් පිරිහීම නිසයි.

අනුන්ට හිංසා පීඩාකිරීම හා නොයිවසනබව තම ගෙදර සිට විහිද යයි. ඇතැම් පිරිමි තම බිරිඳට හා දරුවනට ස්වල්පයකුදු ඉවසීමක් නැතිව අකාරුණික ලෙස හිංසා පීඩා කරන බව අපි දනිමු. එසේම තම ස්වාමිපුරුෂයාට කඩාපනින, තම වැදූ දරුවන්ට අකාරුණික ලෙස සලකන මව්වරුද අප අතර බහුලය. ඒ වගේම තම දෙමාපියනට හිංසා පීඩාකරන, ඔවුන්ගේ සිත්වලට ඉමහත් වදදෙන කරදරකාරී අකීකරු දරුවන්ද අප සමාජයේ එමට ය.

අද ලෝකයේ සුළු හා මහා පරිමාණ ගැටුම් වලට හේතුවද මෙවැනි ගුණධර්ම වලින් මිනිසා ඈත්වීමයි. උතුම් ගුණ ධර්මවලින් ඈත්වූ පුද්ගලයින් වඳ පීදුණු කෙසෙල් ගස් හා සමානය. කිසි කෙනෙකුකුට කිසිම ප්‍රයෝජනයක් නැත.

එවැනි පුද්ගලයින් රටක සමාජයක බහුල වෙත්ම ඒ රට පාලනය කළ නොහැකි තත්වයකට පත්වෙයි. ඒ රට කිසිදු දියුණුවකට නොඑයි. නීති රීති පවත්වාගෙන යාමට නොහැකි වෙයි. එබඳු රටවල් අසාර්ථක රාජ්‍යයන් ලෙස ලෝකයේ ගර්හාවට ලක්වෙයි.

අද ඉවසීමේ ගුණය බොහෝ අය ළඟ දුර්ලභ වූවකි. සුළු සුළු වාද භේද වැනි ගැටුමකින් පටන්ගෙන අවසානයේ ජීවිත දහස් ගණන් බිලිගන්නා මහා පරිමාණ යුද්ධ වලට ද ප්‍රධානතම හේතුව ඉවසීම නොමැතිවීමයි. ඉවසීමේ සීමාව ඉක්ම ගිය සැණින් එතැන ගැටළුවක් මතුවී කෙළවර මිනිස් ඝාතනවලින් වන්දි ගෙවන නිමා නොවන යුද කෝලාහල සුලභ දෙයක් බව අද ලොව දෙස බලන විට හැඟීයනවා ඇත.

ඉවසීම හොඳ ගුණයකි. බුදු දහමේ එය පාරමිතාවක් වශයෙන්ද සඳහන් වේ. සතුරන් ජයගැනීමට ඇති ප්‍රබල අවියද සමහර විට ඉවසීමයි.

ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය
මහමෙර උසුලනා මිහිකතටත් වැඩිය
යන පද්‍යයෙන් කියැවෙන්නේද එයම ය.

බුදුරජාණන් වහන්සේ දේශනා කර ඇත්තේ යුදට වන් ඇතෙකු සතර දෙසින් එන හී වරුසාවන් ඉවසන්නාක් මෙන් තමන්ද සතර දිසාවෙන් පුහුදුන් පුද්ගලයින්ගෙන් එන නින්දා අවමන් ඉවසන බවයි. ඉවසීමෙන් සැනසීම උදාකරගත හැකි බව අපේ ව්‍යවහාරයේ නිතර භාවිතා වන්නකි.

එනිසා සැබැවින්ම ඉවසීම බොහෝ දෑ ජයගැනීමේ උතුම් ගුණයකි. අටලෝ දහමින් කම්පා නොවී ඒවා දරා ගැනීමේ හැකියාව කෙනෙකුට ඇත්නම් ඔහු සතර දිගින් හමන මහා සුළඟට කම්පා නොවන ඉන්ද්‍රඛීලයක් මෙනි.

ඉහතකී අගනා පද්‍යයේ අවසනට සඳහන්වන ආකාරයට අවිහිංසාව අගයන, කාරුණිකවූ, දයාපරවශ පුද්ගලයින් හැම කෙනෙකුටම ආශ්‍රය කිරීමට සුදුසු පුද්ගලයින් ය. ඔවුන්ගේ ඇසුර ජීවිතයේ යහපත් ආකල්පයන්ට මංපෙත් විවර කිරීමකි. එබඳු උදාර පුද්ගලයින්ගේ ආශ්‍රය සැබැවින්ම මෙලොව සාමකාමී ජීවිතයක් ගතකිරීමටත්, පරලොව ස්වර්ගගාමී වීමටත් අගනා හිණිමඟකි.



♦ *රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති*
***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
***ලන්ඩන් බෞද්ධ විහාරය***
**London Buddhist Viharaya**
**The Avenue, London W4 1UD**

# The sorrow and sadness

Sorrow and sadness is a burning of mind associated with loss of relatives, loss of job, social position, lover, spouse, and whatever favoured belonging. Where grief oppresses mind, sorrow has inner consuming as characteristic. Its function is to consume the mind completely, as if eating it up from inside.

It is manifested as a constant gloomy sadness of a deprived depressed mind. It is suffering, because it is an intrinsic mental torment, where the mind with this melancholic state as its basis & source tortures itself even more! This sadness is part & parcel of the The 1st Noble Truth on Suffering...

Sorrow is like a poisoned dart !
That penetrates a being's heart
Setting up a consuming burning there
Like burning with a red-glowing spear
This state of mind brings future pain:
Such as disease, and then ever again:
Ageing and death, so one may thus tell
Wherefore it is called pain as well...



♦ **by Ven Bhikku Samahitah**

**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**